3.උප්පැන්න සහතික නම් වෙනස් කිරීම

3.1සුදුසුකම්

රිදීගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් බල ප්‍රදේශයක රෝහලක උපත ලබා තිබීම හා පිළිගත හැකි සාක්ෂි වල නම භාවිතාකර තිබීම. රෙජිස්ට්‍රාර්ගේ ලිවීමේ දෝෂයකින් නම වෙනස් වී තිබීම.

3.2ඉල්ලුම්පත් ඉදිරිපත් කිරීමේ ක්‍රියාවලිය
(ඉල්ලුම්පත් ලබාගතහැකි ස්ථාන ,ඉදිරිපත් කළ යුත් ස්ථානය,කවුන්ටරය හා වෙලාවන්)

3.2.1ඉල්ලුම්පත් ලබාගත හැකි ස්ථාන :
උපතට අදාළ කොට්ඨාශයට අයත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී

3.2.2ඉල්ලුම්පත් ලබා ගැනීමට ගෙවිය යුතු ගාස්තු :
ඉල්ලුම්පත් ලබා ගැනීමේදී නොව අයදුම්පත් සම්පූර්ණ කර ඉදිරිපත් කිරීමේ දී ප්‍රකාශ පත්‍රය සඳහා රු 50/=ක ගාස්තුවක් රජයට ගෙවිය යුතුය.

3.2.2ඉදිරිපත් කළ යුතු වේලාවන් :
සතියේ වැඩ කරන දින වලදී පෙ.ව.9.00 සිට ප.ව.2.45 දක්වා

3.2.3සේවාව ලබා ගැනීමට ගෙවිය යුතු ගාස්තු : ගාස්තු ගෙවිය යුතු නැත

3.3සේවාව ලබා දීමට ගතවන කාලය (සාමාන්‍ය සේවා හා ප්‍රමුඛ සේවා) : සති 02

3.4අවශ්‍ය සනාථ කරන ලියකියවිලි

27 වගන්තිය යටතේ උප්පැන්නයක නම සංශෝධනය යුතුයි

***සම්පූර්ණ නමට සාක්ෂි 04ක් තිබිය යුතුයි**

***ඉන් 03ක්වත් වසරකට වඩා පැරණි සාක්ෂි විය යුතුයි**

අනිවාර්ය ලිපි ලේඛන.

- අදාල උප්පැන්නයේ මුල් පිටපත
- **අදාල** අයදුම්පත්‍රය

1.වයස අවු.21 ට අඩු නම් මව/පියා/භාරකරු විසින්
2.වයස අවු.21 ට වැඩි නම් තමා විසින්

- ග්‍රාම නිලධාරී නිර්දේශය
- දිවිරුම් ප්‍රකාශය
- පුවත්පත් දැන්වීම
- ඉල්ලීම් ලිපිය
- ජාතික හැඳුනුම්පත හා එහි පොටෝ කොපියක්

වසරකට වඩා නම භාවිතා කරන බවට ලිඛිත සාක්ෂි (සාක්ෂි වල ඔරිජිනල් හා පොටෝ කොපි රැගෙන එන්න)

- බැංකු ගිණුම් පොතක්
- ජාතික හැඳුනුම්පත
- ශිෂ්‍ය කාර්ය දර්ශනය/විදුහල්පතිගේ ලිපියක්
- විවාහ සහතිකය/දරුවන්ගේ උප්පැන්න සහතිකය
- ඡන්ද හිමි නාම ලේඛනයේ උද්ධෘතයක්
- ලියාපදිංචි සමිතියක සාමාජික පාස් පොතක්
- රක්ෂණ ඔප්පුවක්
- අධ්‍යාපන හෝ කුසලතා සහතික පත්‍ර.

(ප්‍රකාශකයාගේ වයස වැඩිවන ප්‍රමාණය අනුව ඔහුගේ /ඇයගේ යෝජිත නම භාවිතා කළ බවට ලියවිලි ප්‍රමාණය වැඩිවිය යුතුයි)

3.5සේවා භාර මාණ්ඩලික නිලධාරීන්

තනතුර	නම	අංශය	දුරකථනය	ෆැක්ස්	ඊ - මේල්
අ.දි.රෙ.	ඩබ්ලිව්.ඒ.කේ.එල්.ප්‍රසන්ති	දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්	0372252038	0372252038	ridi_acc@yahoo.com

3.6ව්‍යතිරේක හෙවත් ඉහත අවශ්‍යතා වලින් බැහැර වන අවස්ථා හා විශේෂ තොරතුරු
සංශෝධනයේ ස්වරූපය අනුව සංශෝධනයට අවශ්‍ය වෙනත් ලියවිලි ඇතොත් අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් විසින් දැනුම් දෙනු ඇත..

3.7ඉල්ලුම්පත් ආකෘතිය (ආකෘති පත්‍රයක් අමුණන්න)
f,g

3.8සම්පූර්ණ කරන ලද ආදර්ශ ඉල්ලුම්පත (සම්පූර්ණ කරන ලද ආකෘති පත්‍රයක් අමුණන්න)
සංශෝධනයේ ස්වරූපය අනුව අකෘති පත්‍රය සම්පූර්ණ කරන අයුරු වෙනස් වේ.